# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2147/3 – 2019 ඔක්තෝබර් 28 වැනි සඳුදා – 2019.10.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම මෙයින් ප්‍රකාශ කරමි.

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කිණිගොඩ කෝරළේ සුළු කොට්ඨාසයේ, අංක 9D කොත්තනවත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, ඕවත්ත ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක KE/RMB/2015/148 හා 2015.11.30 දිනැති පූගමන අනුරේඛනයේ පහත සඳහන් ඉඩම් කොටස් වලට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – මානඑළිය නොහොත් පල්ලේනාරම්පොත – ප්‍රමාණය: හෙක්. 0.4391ක් පමණ**

උතුරට: ඇළ හා මානඑළිය *නොහොත්* පල්ලේනාරම්පොත; නැගෙනහිරට: මානඑළිය *නොහොත්* පල්ලේනාරම්පොත; දකුණට: අරබ්බොඩ පිල්ලෑව හා කැබලි අක්ෂර B; බටහිරට: කැබලි අක්ෂර B, ඇළ හා කොටකුඹුර.

02. **කැබලි අක්ෂර 'B' – මානඑළිය නොහොත් පල්ලේනාරම්පොත – ප්‍රමාණය: හෙක්. 0.0744ක් පමණ**

උතුරට: ඇළ; නැගෙනහිරට: කැබලි අක්ෂර A හා අරබ්බොඩ පිල්ලෑව; දකුණට: අරබ්බොඩ පිල්ලෑව හා පින්නලන්දවත්ත; බටහිරට: පින්නලන්දවත්ත.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/2/2015/Z/63.
2019 මැයි මස 29 වැනි දින.
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

11 – 889